# ගමට මන්ත්‍රී කෙනෙක් අවශ්‍යයි

## කොළඹ දිස්ත්‍රික් එජනිස අපේක්ෂක
## මිලින්ද මොරගොඩ



සුබවාදී පාලනයක් උදෙසා රජය පොලඹවන හා දිරිගත්වන න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කරමින්, සම්ප්‍රදායෙන් වෙනස් වූ මැතිවරණ ප්‍රචාරයක නියැලෙන අධිකරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සිළුමිණ සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකි.

**ඔබගේ මැතිවරණ කටයුතු යම් ආකාරයකට ප්‍රතිපත්ති ගරුකයි. ඇයි එහෙම වෙනසකට ගියේ...?**

මම මීට පෙර මැතිවරණවලදීත් පෝස්ටර් කටවුට්, බැනර් භාවිත කළේ නැහැ. අපි අලුත් සංස්කෘතියකට යන්න නම් මගේ මතය වුණේ ප්‍රතිපත්ති ගරුක විය යුතු බවයි. එසේම ජනතාවට ගරු කරන සංස්කෘතියක් නිර්මාණය විය යුතුයි.

උදාහරණයක් ලෙස වසර ගණනාවකට කලින් අපේ පොලිස් භටයා අතේ තිබුණේ බැටන් පොල්ල. අද එය තුවක්කුවට පෙරලිලා. දැන් එය නැවත බැටන් පොල්ලට යා යුතුයි. දේශපාලන සංස්කෘතියත් යහපත් යුගයකට යා යුතු යි. 2000 දී පමණ කිරුළපනේදී තරුණ ළමයෙක් වෙඩි තියලා මැරුවා පෝස්ටර් ගහද්දි ඔබට මතක ඇති. මම මේ සිදුවීමේදී තමයි තීරණයක් ගත්තේ. පෝස්ටර් ගහද්දි මරන්න තරම් අපේ සමාජය වැටිලා තියෙනවා. මේ නිසා එදා මම ගත් තීරණය අදත් එලෙසමයි.

**ජනතාවට අවංකව සේවය කරන දේශපාලඥයින්ට ඡන්දය ලබා ගැනීම එතරම් අපහසු නැහැ. ඡන්දයක් දිනන්න නම් අපේක්ෂකයෙක් විශාල මුදල් සම්භාරයක් වැය කළ යුතු ද?**

මගේ මතය අවශ්‍ය නැහැ කියලා. අපි ඉදිරියේදී ඡන්ද ක්‍රමය වෙනස් කරනවා.

මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ද පනතක් ගෙනා යුතුයි. විනිවිදභාවයක් තිබිය යුතුය.

ඕනෑම කෙනකුට මේ වගේ සංස්කෘතියකට ඇතුළු වුණොම වෙනස් වෙන්න අමාරුයි.

**මේ මැතිවරණ ක්‍රමය වෙනසකට ලක් කළ යුතු ද?**

වසර ගණනාවක සිට මේ වෙනස්වීම ගැන කතා කරනවා. අපිට ගැලපෙන්නේ මිශ්‍ර ක්‍රමයක්. හැම ආසනයටම මන්ත්‍රී කෙනෙක් අවශ්‍යයි. හැම පළාත් සභාවකටම, ප්‍රාදේශීය සභාවකටම අවශ්‍යයි. ගමට මන්ත්‍රී කෙනෙක් අවශ්‍යයි. ඒ නිසා එය මුලින්ම කළ යුතුයි.

අනුපාත ක්‍රමය අනුව කොටසක් දිස්ත්‍රික් මට්ටමින් තේරිය යුතුයි. අපි මේ දෙකම සමබරව කළ යුතුයි. අපිට ගැලපෙන ක්‍රමයත් එයයි.

**ඔබ පසුගියදා ප්‍රතිපත්ති ප්‍රකාශයක් එළි දැක්වූවා. ඒ ගැන සඳහනක් කළොත්...?**

මහින්ද චින්තන රාමුව පදනම් කරගෙන අපි මාතෘකා 12 ක් තෝරා ගත්තා.

මීට වඩා කරුණු තිබිය හැකියි. පුර නැගුම සංකල්පය තුළ අපි නගරයට හඬක් දෙනවා. අද සමාජය තුළ සිවිල් සමාජයට ඇති බලය අඩුයි. අපි හැම විටම සිවිල් සමාජය මූලික කර ගත්තා.

ඒ යටතේ මහජනතාවට ගරු කරන දේශපාලන සංස්කෘතියක්, පුර නැගුම හා සෙවණ ව්‍යාපෘති, තොරතුරු දැනගැනීමේ අයිතිය මගින් දූෂණ අවම කිරීම, නීති හා යුක්තිගරුක සමාජයක් ගොඩනැගීම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කිරීම, ආර්ථික සංවර්ධනය, බෞද්ධ දර්ශනය ජාත්‍යන්තරයට ගෙන යාම ආදී වැදගත් අංශ කිහිපයක් මේ න්‍යාය පත්‍රයට ඇතුළත් වෙනවා.

මෙය කොළඹ දිස්ත්‍රික්කය, නගරය ගැන වුවත් මුළු රටටම අදාළ කරගත හැකියි. උදාහරණයක් ලෙස අපි මෙතනදී දූෂණය, අපරාධ, මත්පැන් ගැන කතා කරනවා. අපි කොළඹ නගරයෙන් මෙය පටන් ගෙන මාධ්‍ය හරහා රටට පණිවුඩය ගෙනියනවා. මේවා බලහත්කාරයෙන් රටට පොවන්න බැහැ. මිනිසුන්ගේ උනන්දුව තිබිය යුතුයි. මේවා අමුතු දේවල් නොවේ. ඉන්දියාව මෙය සාර්ථක කර ගෙන තියනවා. සමහරු හිතනවා මෙය බලපාන්නේ ඉහළ පන්තියට පමණක් බව. උදාහරණයක් ලෙස දරුවෙක් පාසලට ඇතුළත් කරගන්න දේශපාලඥයෙක්ගේ ලියුමක් අවශ්‍යයි. සමහර විට පොඩි වැඩක් කරගන්නත් කාගෙන් හරි ලියුමක් ඕන. අද ඒ වගේ තැනට රට පත්වෙලා.

**ඔබතුමා කියන පරිදි කාලයක් තිස්සේ සමාජයේ හැඩගැසුණු ඔය සංස්කෘතිය ලේසියෙන් වෙනස් කරන්න පුළුවන් ද?**

1971 අපේ තරුණයන් අතර කැරැල්ලක් තිබුණා. එයින් සෑහෙන පිරිසක් නැතිවුණා. 87 කැරැල්ලක් තිබුණා. එය 71 ට වඩා නපුරුයි. ඊට පස්සේ එල්ටීටීඊ කැරැල්ල ඇතිවුණා. මේ ප්‍රශ්න එදා විසඳ ගත්තේ නැතිනම් ඊට පස්සේ එන කැරලි ඊටත් වඩා දරුණු වෙන්න ඉඩ තිබුණා. ජනාධිපතිතුමාට පුළුවන් වුණා ත්‍රස්තවාදය නැති කරන්න. කවුරුත් විශ්වාස කළේ නැහැ කරන්න පුළුවන් වෙයි කියලා. මගේ විශ්වාසය තියනවා ජනාධිපතිතුමාට මේ දේවලුත් කරන්න පුළුවන් බව. අපි කළ යුත්තේ එතුමාට අවශ්‍ය ශක්තිය ලබා දෙන එක යි.

**අනිකුත් අමාත්‍යාංශ වලට වඩා ඔබ අමාත්‍යාංශය හරහා මහජනතාව අතරට යන්න අමාරුයි. ඔබ වටා සිටින්නේ විද්වත් පිරිසක්. මේ තත්ත්වය ජයග්‍රහණයට බාධාවක් ද?**

අධිකරණ අමාත්‍යාංශය ගැන එහෙම හිතන්න බැහැ. මහාධිකරණ වල නඩුවල තුනෙන් පංගුවක් දරුවන් වෙනුවෙන් වූ නඩු. ඒ වගේම රටේ දැවෙන ප්‍රශ්න හරහා අපි ජනතාව අතරට යනවා.

බන්ධනාගාරය පැත්තෙන් ගත්තොත් සිවිල් සමාජයත් සමග නිතරම සම්බන්ධ යි. අද කොළඹ නගරයේම මත්ද්‍රව්‍ය ප්‍රශ්නය විශාල වශයෙන් තියනවා.

මේවා පවුල් වල දැවෙන ප්‍රශ්න. ඒ වගේම හැම දෙනාගේම බලාපොරොත්තුවක් තියනවා යුක්තිය ඉෂ්ට වෙයි කියලා. අධිකරණ අමාත්‍යාංශය හරහා ජනතාව විශාල බලාපොරොත්තු සමුදායක් ඇතිකරගෙන තියනවා. යුද්ධ කාලයේදී අධිකරණය ඒ සඳහා යොදවන්න වුණා. දැන් රට නිදහස්. දැන් අපිට අධිකරණය දැවෙන ප්‍රශ්න සඳහා යෙදවිය හැකියි. ජනතා සේවය කියන්නේ රැකියා ලබා දීමක් පමණක් නොවෙයි. මේ නිසා මම අපේ අමාත්‍යාංශය ජනතාවට සමීප නැහැ කියන මතයේ සිටින්නේ නැහැ.

**ඉදිරියේදී අමාත්‍ය මණ්ඩලය 35 කට සීමා කිරීමේ සැලැස්මක් යෝජනා වෙලා තියෙනවා. මේ නිසා දැනට අමාත්‍ය ධූර දරන බහුතරයකට අමාත්‍ය ධූර නොලැබෙන්න පුළුවන්. ඔබටත් එහෙම වෙයි ද?**

අමාත්‍ය ධූර සඳහා මට උනන්දුවක් නැහැ. හැම මන්ත්‍රීවරයෙක්ම ඇමැතිවරයෙක් වෙන්න දරන උත්සාහය වෙනස්විය යුතුයි. ඇමැති පිරිස අඩුවිය යුතුයි. මධ්‍යම ආණ්ඩුව ප්‍රතිපත්ති සකසලා පළාත් සභාවෙන් ඒවා ක්‍රියාත්මක කරලා ප්‍රාදේශීය සභාවෙන් බිම් මට්ටමින් ඒවා ක්‍රියාත්මක කර බලය විමධ්‍යගත වුණොත් ඇමැති තනතුරු එතරම් අවශ්‍ය නැහැ.

නමුත් අද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලය විමධ්‍යගත කර තිබුණත් ඒවා නියම පරිදි ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. දේශපාලඥයින්ට රැකියා දීමට අයිතියක් නැහැ. එය රාජ්‍ය ප්‍රතිපත්ති හරහා විනිවිද බවකින් සිදුවිය යුතුයි. හැම මන්ත්‍රීවරයෙක්ම ඇමැතිවරයෙක් වෙන්න අවශ්‍ය නැහැ. ඕනෑම මන්ත්‍රීවරයකුට තම තනතුරේ සිට ජනතාවට ඉතා හොඳ සේවයක් සැපයිය හැකි යි.

**යුද අධිකරණයේ විනිසුරු මඩුල්ල සම්බන්ධව විවිධ චෝදනා තියනවා. අධිකරණ ඇමැතිවරයා ලෙස ඔබට මේ ගැන කිව හැක්කේ කුමක් ද?**

මේ සෑම දෙයක්ම යුද නීතිය හරහා සිදුවෙනවා. ඒ සියල්ල නිවැරැදි භාවයකින් හා විනිවිද භාවයකින් යුතුව සිදුවෙයි.

**අධිකරණවල නඩු ඇසීමට විශාල කාලයක් ගත වෙනවා. ඊට ගෙන ඇති පියවර මොනවා ද?**

අධිකරණ ඇමැති ලෙස මම විධායකය නියෝජනය කරනවා. අධිකරණය ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා. ප්‍රමාදය ගැන පැහැදිලි විවාදයක් තියනවා. කාලය අඩු කරන්න අපි දැනටමත් විවිධ උත්සාහ ගන්නවා. ඒ සඳහා කමිටු පිහිටුවා තියනවා. කමිටුවල වාර්තා ලැබෙමින් තියනවා. නමුත් තවම අවසන් තීරණයකට ඇවිත් නැහැ.

**සංවාද සටහන**
**සුභාෂිණී ජයරත්න**